සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# භූගෝල විද්‍යාව - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- සෑම ප්‍රශ්නයකට ම අදාළ නිවැරදි පිළිතුර තෝරා ඊට හිමි අංකය දී ඇති වරහන් තුළ යොදන්න.

## I කොටස

(01) ශ්‍රී ලංකාවේ භාවිතාවන 1:50000 භූ ලක්ෂණ සිතියමක පර්යන්ත තොරතුරු පමණක් අඩංගු වන පිළිතුර තෝරන්න.

(1) මාර්ග, ජනාවාස, සූචකය, පරිමාණය
(2) පරිමාණය, දිශාව, සිතියමේ අංකය, පරිපාලන මායිම් දක්වන සටහන
(3) ගොඩනැගිලි, පරිපාලන මායිම්, සිතියම් වර්ගය, සිතියමේ නම.
(4) භූරූප, ලඳු කැළෑ, සිතියමේ අංකය, සූචකය
(5) සූචකය, ලඳු කැළෑ, වනාන්තර, සිතියමේ නම (........)

(02) 1:50000 සිතියම් කොටසක වර්ගඵලය වන්නේ මින් කවර පිළිතුරද?

(1) $2000\ cm^2$ (2) $1000\ cm^2$ (3) $7000\ cm^2$
(4) $2000\ km^2$ (5) $4000\ cm^2$ (........)

(03) මෙහි දැක්වෙන සිතියම් කොටසෙහි පැවතිය හැකි භූ ලක්ෂණ වන්නේ මින් කවරක්ද?




(1) උත්තල බෑවුම හා අවතල බෑවුම
(2) කඳුවැටිය හා කන්ද
(3) ගංගාව හා දිය ඇල්ල
(4) හැඩපලු ගංගාව හා කපොල්ල
(5) ආයතගාමී නිම්නය හා තීර්යක් නිම්නය. (........)

(04) මෙම රූප සටහනේ දැක්වෙන්නේ භූගෝල විද්‍යාවේ දත්ත පෙන්වනු ලබන ප්‍රස්ථාරික සටහනකි. මෙය,




(1) සරලතීරු ප්‍රස්ථාරයකි.
(2) සංකීර්ණ තීරු ප්‍රස්ථාරයකි.
(3) සංයුක්ත තීරු ප්‍රස්ථාරයකි.
(4) තිරස් තීරු ප්‍රස්ථාරයකි.
(5) සංයුක්ත රේඛා ප්‍රස්ථාරයකි. (........)

(05) අපකිරණ මිණුමක් ලෙස අන්තර් චාතුර්ථික පරාසය ගණනය කරනු ලබන්නේ මින් කවර ක්‍රමයටද?

(1) $Q_3 - Q_1$ (2) $\frac{Q_3 - Q_1}{4}$ (3) $Q_2 + Q_1$

(4) $\frac{Q_3 + Q_1}{4}$ (5) $\frac{Q_3 - Q_1}{2}$ (........)

The National e-learning Portal for The General Education

(06) සිතියමක සමාන වටිනාකම් සහිත ස්ථාන යාකොට අඳිනු ලබන රේඛා නිරූපණය කරයි නම් එය හඳුන්වන්නේ මින් කවර නමකින්ද?

(1) ත්‍රිමාණ සටහන (2) පින්තූර සටහන (3) සංඛ්‍යාත බහු අස්‍රය
(4) සම සංඛ්‍යා සිතියම (5) විසරණ සටහන (........)

(07) සංඛ්‍යා දත්ත නිරූපණය සඳහා යොදාගන්නා ප්‍රස්තාර ක්‍රමයක් මෙම රූපයෙන් දැක්වේ. මෙහි දැක්වෙන දත්ත ව්‍යාප්තිය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.




(1) මාත රහිත දත්ත ව්‍යාප්තියකි.
(2) ද්වි මාත ව්‍යාප්තියක් ඇත.
(3) බහුමාත ව්‍යාප්තියක් ඇත.
(4) අවම වටිනාකම් බහුල දත්ත ව්‍යාප්තියකි.
(5) මාධ්‍ය අගය උපරිම වටිනාකමට සමීප වී ඇත. (........)

(08) ශ්‍රී ලංකාවේ කෘෂි අංශය හා GIS තාක්ෂණය සම්බන්ධ වී ඇති බවට දැක්වෙන නිවැරදි ප්‍රකාශය මින් කුමක්ද?

(1) කෘෂිකර්මයට අදාළ කාලගුණික හා දේශගුණික තොරතුරු ලබා ගැනීම.
(2) වගා බිම් වලට අවශ්‍ය පොහොර වර්ග නිෂ්පාදනය
(3) ලෝකයේ කෘෂි බිම් ප්‍රදේශ සමග සැසඳීම.
(4) වගා සඳහා අවශ්‍ය වන භූමි ප්‍රදේශ වල යෝග්‍යතාවය බැලීම.
(5) නිෂ්පාදනවලට ඇති ඉල්ලුම සලකා බැලීම. (........)

(09) GIS තාක්ෂණය භාවිතා කරමින් අඳින සිතියමක යොදාගත හැකි දත්ත මූලාශ්‍ර පමණක් අඩංගු පිළිතුර මින් කුමක්ද?

(1) සිතියම, චන්ද්‍රිකා ප්‍රතිබිම්බ, දත්ත වගුව (2) සිතියම, ගුවන් ඡායාරූප, නිරීක්ෂණ
(3) දත්ත වගුව, පරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා (4) ගුවන් ඡායාරූප, චන්ද්‍රිකා ප්‍රතිබිම්බ, පර්යේෂණ
(5) නිරීක්ෂණ, පරීක්ෂණ, පර්යේෂණ (........)

(10) ලෝකයේ හදිසි කාලගුණ තත්ත්ව නිසා වන හානි හා ඒවා සිදුවන වේගය දැනගැනීමට භාවිතා කළ හැකි නව තාක්ෂණික ක්‍රමවේදය වන්නේ මින් කවරක්ද?

(1) ගුවන් ඡායාරූප (2) දුරස්ථ සංවේදන චන්ද්‍රිකා
(3) GPS උපකරණ (4) GIS දත්ත ගබඩාව
(5) සංවේදන පටිගත කිරීම. (........)

(11) උතුරු හා දකුණු අක්ෂාංශ 66½ ඉහළ ප්‍රදේශවල පිහිටි ශීත දේශගුණ කලාපවල ඇති සුවිශේෂ ලක්ෂණය මින් කුමක්දැයි තෝරන්න.

(1) 250 mm - 300 mm අතර වර්ෂාපතනය (2) 20 ට වැඩි උෂ්ණත්වය
(3) පැහැදිලි ශීත හා උණුසුම් ඍතු පැවතීම (4) වසර පුරාම සිදුවන හිම පතනය
(5) වසරේ එක් කාලයකට පමණක් පවතින අධික උෂ්ණත්වය (........)

(12) ශ්‍රී ලංකාව හරහා ගමන් කරන වාසුළිවල ගමන් මාර්ගය නිවැරදිව දැක්වෙන්නේ කවර පිළිතුරේද?




(........)

(13) භූ විද්‍යා කාල චක්‍රයට අනුව ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙනස්වීම හා ඉන්දියා ලංකා අතර කලාපය මුහුදට යටවීම සිදුවූයේ මින් කරව අවධියේදී ද?

(1) ප්‍රාග් කේම්බ්‍රිය අවධිය (2) අංගාරධර අවධිය (3) ජුරාසික අවධිය
(4) මයෝසීන අවධිය (5) ජලය ස්ටෝසීන අවධිය (........)

(14) ගලන ජලයේ ක්‍රියාකාරීත්වය නිසා බිහිවන ගං දඟරයක දික් පැතිකඩ සටහනක් දකුණු පස රූපයේ දක්වා ඇත. එහි A හා B අවස්ථාවේද, C හා D අවස්ථාවේද සිදුවන ක්‍රියාවලීන් පිළිවෙලින් දැක්වූ විට නිවැරදි පිළිතුර කුමක්ද?




(1) සිරස් සංඝර්ෂණය හා බාදනය
(2) ආංශික සංඝර්ෂණය හා බාදනය
(3) ද්‍රාව ක්‍රියාව හා පත්ල බාදනය
(4) සිරස් සංඝර්ෂණය හා බාදනය
(5) ආංශික ඝර්ෂණය හා නිධි සාදනය (........)

(15) ලිහිටුම, මඩදෝරය හා පාෂාණපතනය සිදුවන්නේ මින් කවර ක්‍රියාවලියක් ඇසුරෙන්ද?

(1) සුනාමි (2) භූමිකම්පා (3) ස්කන්ධ හායනය
(4) යමහල් ක්‍රියාවලිය (5) විභේද වීම. (........)

(16) වෙරළාශ්‍රිත ප්‍රදේශවල තරංග බාදනය නිසා නිර්මාණය වන භූරූප පමණක් අඩංගු පිළිතුර මින් තෝරා දක්වන්න.

(1) කොරල්පර, සලපිල, දඹ (2) වාඩි, වැල්ල, හිරිටැඹ (3) වැලිපර, අවුර, මුහුදු කුළු
(4) දඹ, ආරුක්කු, මුහුදු කුළු (5) දඹ, බහඩා, කොරල් පර (........)

(17) 1941 දී මහාචාර්ය රෝස්බි විසින් වායුගෝලීය සුළං රටාවේ ත්‍රිසෛලාකාර කල්පිත ගොඩ ගැනීමට මූලික වූයේ මින් කවර සොයාගැනීමක් නිසාද?

(1) සමක අඩු පීඩන කලාප සොයා ගැනීම නිසාය.
(2) උප ධ්‍රැව අඩු පීඩන කලාප හා උප නිවර්තන වැඩි පීඩන කලාප සොයා ගැනීමෙනි.
(3) වෙළඳ සුළං සොයා ගැනීමෙනි.
(4) භූතල සුළං දිශාව පෘථිවි භ්‍රමණයත් සමග වෙනස් වීම අධ්‍යයනයෙනි.
(5) පීඩන රේඛා සොයා ගැනීමෙනි. (........)

(18) උත්තරාර්ධ ගෝලයේ පිළිවාසුලියක ස්වරූපය දැක්වෙන්නේ මින් කවර පිළිතුරකද?

(1) (2) (3) (4) (5) (........)




(19) දිග ශීත ඍතුව, කෙටි ගිම්හානය, ගිම්හාන උෂ්ණත්වය 20°C කි. මෘදු ලී සහිත ශාක කඳන් ඍජුය. ඉහළ ලක්ෂණ සහිත බියෝමය මින් කවරක්ද?

(1) සැවානා (2) නිවර්තන වනාන්තර (3) සෞම්‍ය කලාපීය වනාන්තර
(4) මධ්‍යධරණී වනාන්තර (5) ටයිගා වනාන්තර (........)

(20) ශ්‍රී ලංකාවේ සංරක්ෂිත වනයකට ඇතුළු වීම හා හානි කිරීම නීති විරෝධී බැව් ප්‍රකාශ කළේ මින් කවර සංරක්ෂණ ක්‍රමෝපාය මගින්ද?

(1) කැලෑ ආඥා පනත (2) ජාතික උරුම වන භූමි පනත
(3) අපනයන නීති පනත (4) වෘක්ෂලතා ආරක්ෂක අඥා පනත
(5) පාරිසරික හා වන ආඥා පනත (........)

(21) ආසියාවේ විශාලතම පුරවර ලෙස සැලකිය හැකි ස්ථාන අඩංගු පිළිතුර තෝරන්න.

(1) යොකොහාමා, මුම්බායි, ෂැංහයි, ජාකර්තා
(2) ටෝකියෝ, යොකොහාමා, කල්කටා, මුම්බායි
(3) කොළඹ, කල්කටා, බීජිං, මදුරාසි
(4) චෙන්නායි, බීජිං, ජාකර්තා, සෝල්
(5) සෝල්, ජාකර්තා, ක්වාලාලම්පූර්, බොම්බාය (........)

(22) ලෝක ජනගහන වර්ධනය අනුව මිලියන 1000 සම්පූර්ණ වූයේ මින් කවර වර්ෂයේදීද?

(1) ක්‍රි.ව. 1700 (2) ක්‍රි.ව. 1800 (3) ක්‍රි.ව. 1850
(4) ක්‍රි.ව. 1900 (5) ක්‍රි.ව. 2000 (........)

(23) ලෝකයේ මෝටර් රථ නිෂ්පාදනය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අතීතයේ චීනය නොවැදගත් වුවද වර්තමානයේ ලොව ප්‍රමුඛතම මෝටර් රථ නිෂ්පාදකයා බවට පත්ව ඇත.
(2) ප්‍රංශය මෝටර් රථ නිෂ්පාදනයේ පළමු 10 දෙනා අතරින් 2014 වන විට ගිලිහී යාම.
(3) ජපානය සියලු රටවල් අභිබවා මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රථම ස්ථානය ගැනීම.
(4) නැගෙනහිර ආසියා රටවල නිෂ්පාදනයේ අඩුවීමක් දක්නට ලැබීම.
(5) ඇමරිකා එක්සත් ජනපදය 2013 වන විට බහුලවම ආසියාකරයේ වෙළඳපල අල්ලාගැනීම. (........)

(24) චීනයේ දකුණු මැන්චූරියාව, බීජිං ප්‍රදේශය හා ෂෙන්ප්‍රවාං ප්‍රදේශ වැදගත් වන්නේ මින් කවර කරුණක් සඳහා ද?

(1) මෝටර් රථ නිෂ්පාදනය (2) නැව් කර්මාන්තය
(3) කපු රෙදි පිළි කර්මාන්තය (4) ගුවන් යානා නිෂ්පාදනය
(5) යකඩ හා වානේ නිෂ්පාදනය (........)

(25) විශාල ලෙස පෙට්‍රෝ රසායන කර්මාන්තය ව්‍යාප්ත වී ඇති කලාපය මින් කුමක්ද?

(1) ආසියානු රටවල් හා අප්‍රිකානු රටවල්
(2) මැද පෙරදිග රටවල් හා අප්‍රිකානු රටවල්
(3) ඇමෙරිකා එක්සත් ජනපදය හා බටහිර යුරෝපා රටවල්
(4) ඇමෙරිකා එක්සත් ජනපදය හා දකුණු ඇමෙරිකානු රටවල්
(5) ආසියානු රටවල් හා ඇමෙරිකා එක්සත් ජනපදය (........)

(26) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය නවීකරණය කිරීමේ පියවරක් ලෙස ඓන්ද්‍රීය පොහොර භාවිතය ප්‍රචලිත කිරීමට කාබනික පොහොර මධ්‍යස්ථානය පිහිටුවා ඇත්තේ මින් කවර ස්ථානයේ ද?

(1) බට අත (2) ගන්නොරුව (3) හලාවත පිටිපන
(4) ගෝනවල මාකඳුර (5) ගාල්ල මිද්දෙනිය (........)

(27) ලෝකයේ නැව් තැනීමේ කර්මාන්තය සඳහා වැදගත් ස්ථාන කිහිපයක් දකුණු පස ආසියා සිතියමේ දක්වා ඇත. ඒවා 1, 2, 3, 4 ලෙස පිළිවෙලින් නම් කළවිට ලැබෙන පිළිතුර කුමක්ද?




(1) නාගසාකි, උල්සාන්, ෂැංහයි, විශාකාපට්නම්
(2) යොකොහාමා, සෝල්, ෂැංහයි, මදුරාසිය
(3) ටෝකියෝ, සෝල්, ෂැංහයි, කල්කටා
(4) නාගසාකි, උල්සාන්, ඉෂුවාන්, කල්කටා
(5) නාගසාකි, ෂැංහයි, උල්සාන්, විශාකාපට්නම්

(........)

(28) වසර 2050 වන විට මිනිස් කටයුතුවලට බාධා ඇතිකරමින් දේශගුණික වෙනස්වීම් හේතුවෙන් මුහුදු මට්ටම ඉහළ යාමේ තර්ජනයට බහුලවම මුහුණ පාන ඩෙල්ටාව මින් කුමක්ද?

(1) ගංගානම් ගඟේ බ්‍රහ්මපුත්‍ර ඩෙල්ටාව
(2) නයිල් ගංගාවේ ඊජිප්තු ඩෙල්ටාව
(3) රයින් ගංගාවේ ඩෙල්ටාව
(4) හොවැංහෝ ගංගාවේ ඩෙල්ටාව
(5) සින්ධු ගඟේ පාකිස්තානය ආශ්‍රිත ඩෙල්ටාව (........)

(29) යුරෝපා රටවල් ආශ්‍රිතව යුරෝ කලාපය (Euro Zone) පිහිටුවා ගත්තේ මින් කවර කරුණක් සඳහාද?

(1) යුරෝපා සංගමයේ රටවල් එකතු කර ගැනීම.
(2) යුරෝපා රටවල භාණ්ඩ හා සේවා ප්‍රාග්ධන ඒකීය වෙළඳපොලක් යටතට ගැනීම.
(3) යූරෝ මුදල් භාවිතා කරන රටවල් ඒකරාශී වූ කලාපය.
(4) අන්තර් ආණ්ඩු පාලන ක්‍රමය සඳහා වූ කලාපය.
(5) සුපිරි ජාතිකත්වය අනුව පාලන කටයුතු කරගෙන යාම. (........)

(30) බහු ජාතික සමාගම් හරහා ලබාගත් විදේශ ආයෝජන මගින් ලෝකයේ ප්‍රමුඛයින් බවට පත් වී ඇති නිෂ්පාදන අතර චීනය හා මැලේසියාව මගින් සිදුකරනු ලබන ප්‍රධාන නිෂ්පාදනයන් දෙක පිළිවෙලින් අඩංගු පිළිතුර තෝරන්න.

(1) ඉලෙක්ට්‍රෝනික උපකරණ නිෂ්පාදනය හා ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය
(2) රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය හා විදුලි උපකරණ නිෂ්පාදනය
(3) ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය හා විදුලි උපකරණ නිෂ්පාදනය
(4) මෝටර් රථ නිෂ්පාදනය හා පරිගනක නිෂ්පාදනය
(5) රූපවාහිනී නිෂ්පාදනය හා ගුවන්විදුලි යන්ත්‍ර නිෂ්පාදනය. (........)

(ල. 2 x 30 = 60)

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්නයකට පිළිතුරු සපයන්න.**

01. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50000 පරිමාණයේ මොණරාගල භූ ලක්ෂණ සිතියමින් කොටසක් ඔබට සපයා ඇත. එම සිතියම පදනම් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) AB හා CD රේඛාවලින් දැක්වෙන බෑවුම් හඳුනාගෙන නම් කරන්න. (ල. 2)

(2) EF වලින් දැක්වෙන භෞතික ලක්ෂණයේ විශේෂත්වය හා GH රේඛාවලින් දැක්වෙන ලක්ෂණය දක්වන්න. (ල. 3)

(3) සිතියම් ප්‍රදේශයේ මානව ජනාවාස දෙකක් හඳුනාගෙන නම් කරන්න. (ල. 2)

(4) චතුරස්‍රයෙන් දැක්වෙන ප්‍රදේශයේ වර්ගඵලය ගණනය කරන්න. (ල. 2)

(5) මෙම ප්‍රදේශයේ භූ විෂමතාවය හා භූමි පරිභෝගය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ කරුණු තුනක් කටු සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

(6) සිතියම් ප්‍රදේශයේ පවතින පරිවහන රටාවේ විවිධත්වය පැහැදිලි කරන්න. (ල. 5)

02. (1) අංකිත සිතියමක් යනු කුමක්ද? (ල. 2)

(2) අංකිත සිතියමකින් කළ හැකි කාර්යයන් 4 ක් දක්වන්න. (ල. 4)

(3) අංකිත සිතියම් නිර්මාණයේදී උපයෝගී කරගන්නා දත්ත මූලාශ්‍ර 3 ක් දක්වන්න. (ල. 3)

(4) ඔබ ඉහත දැක්වූ දත්ත මූලාශ්‍ර අංකිත සිතියම් නිර්මාණයට උපයෝගී කරගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ල. 3x2 = 6)

(5) දෛශික සිතියමකට වඩා අංකිත සිතියමක තොරතුරු ගබඩා කිරීමේ හැකියාව ඇති බැව් උදාහරණ දෙමින් පහදන්න. (ල. 5)

03. (1) පහත වගුවේ ඇති දත්ත භාවිතයට ගනිමින් ජාල රේඛය හා සංඛ්‍යාත බහුඅස්‍රය නිර්මාණය කරන්න. (ල. 6)

(2) එම දත්ත ආශ්‍රිත මාතය හා මාත පන්තිය ගණනය කරන්න. (ල. 4)

(3) දිස්ත්‍රික්ක අනුව ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය පිළිබඳව ඉහත ප්‍රස්ථාරය ඇසුරින් ඔබේ අදහස් දක්වන්න. (ල. 5)

(4) ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය හා ඝනත්වය දැක්වීමට ඉහත ප්‍රස්ථාර ක්‍රමයේ යෝග්‍යතාව දත්ත ආශ්‍රිත කුටිකතාව ඇසුරින් විමසන්න. (ල. 5)

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ජන ව්‍යාප්තිය

| ජන ඝනත්වය | දිස්ත්‍රික්ක සංඛ්‍යාව |
|---|---|
| 0  200 | 08 |
| 201  400 | 07 |
| 401  600 | 04 |
| 601  800 | 02 |
| 801  1000 | 02 |
| 1000 ට වැඩි | 02 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# භූගෝල විද්‍යාව - II

**13 ශ්‍රේණිය**

**කාලය පැය 03 යි.**

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

---

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

01. (1) පද්ධති යන්න හඳුන්වන්න. (ල. 4)

(2) පෘථිවි භූ පද්ධතියේ පවතින ප්‍රධාන උපපද්ධති වල ක්‍රියාකාරීත්වය වෙන වෙනම දක්වන්න. (ල. 4)

(3) ජෛව ගෝලීය පද්ධතිය අනෙකුත් පද්ධතීන් සමඟ සිදුවන ක්‍රියාකාරීත්වය පෘථිවියේ ජීව පැවැත්මට හේතුවන බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 6)

(4) ඔබ (2) ප්‍රශ්නයේ දැක්වූ එක් උපපද්ධතියක් තෝරාගෙන එහි ලක්ෂණ විග්‍රහ කරන්න. (ල. 6)

02. (1) කෙපන්ගේ දේශගුණ වර්ගයට අනුව A හා B දේශගුණික වර්ග හා උප වර්ග නම් කරන්න. (ල. 3)

(2) ඔබ ඉහත දැක්වූ එක් දේශගුණ වර්ගයක් තෝරාගෙන එහි උපවර්ග ආශ්‍රිතව පහත දැක්වෙන මාතෘකා ඔස්සේ කරුණු පැහැදිලි කරන්න.

★ පිහිටීම

★ දේශගුණික ලක්ෂණ

★ මානුෂ කටයුතු (ල. 3x3 = 9)

(3) ශ්‍රී ලංකාවේ වර්ෂාපතනයේ අවකාශීය ව්‍යාප්ත රටා කෙරෙහි බලපාන දේශගුණික සාධක 4 ක් ආශ්‍රිත ක්‍රියාවලිය වෙන වෙනම උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 8)

03. (1) ග්ලැෂියර් නිර්මාණය වන ප්‍රදේශවල පවතින භෞතික ලක්ෂණ දක්වන්න. (ල. 4)

(2) ග්ලැෂියර් ඛාදනය භූරූප නිර්මාණ ක්‍රියාවලියට දායක වන ආකාරය ග්ලැෂියර් ආශ්‍රිත ඛාදන ක්‍රියාවලි ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(3) ග්ලැෂියර් ඛාදනය නිසා නිර්මාණය වන භූ රූප 4 ක් කටු සටහන් මගින් පැහැදිලි කරන්න. (ල. 8)

(4) ලෝකයේ ග්ලැෂියර් ප්‍රදේශ මිනිසාට ප්‍රයෝජනවත් වන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 4)

04. (1) ලෝකයේ සිදුවන ස්වභාවික උපද්‍රවයන් වර්ග කළ හැකි ආකාරය දක්වන්න. (ල. 3)

(2) ඕනෑම ස්වාභාවික උපද්‍රව 2 ක් තෝරාගෙන ඒවා සිදුවන ආකාරය පහදන්න. (ල. 5)

(3) ඔබ ඉහත දැක්වූ ස්වභාවික උපද්‍රව සඳහා බලපාන ස්වභාවික හේතු හා මානව හේතු වෙන වෙනම පැහැදිලි කරන්න. (ල. 6)

(4) ඉහත දැක්වූ ස්වාභාවික උපද්‍රව නිසා ඇතිවන භෞතික හා මානව බලපෑම් දක්වමින් ඒවා දැනුවත්ව සිටීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 6)

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05. (1) ලෝක ජන සංඛ්‍යා වර්ධනයේ කැපීපෙනෙන අවධි දෙක දක්වන්න. (ල. 2)

(2) ඔබ ඉහතින් දැක්වූ දෙවන ජන සංඛ්‍යා වර්ධන යුගයේ සිදුවූ ජන සංඛ්‍යා වර්ධනයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ල. 6)

(3) ක්‍රි.ව. 1850 මිලියන 1300 ක් වූ ලෝක ජන සංඛ්‍යාව ක්‍රි.ව. 2014 වන විට මිලියන 7000 ඉක්මවීමට හේතු 03 ක් පැහැදිලි කරන්න. (ල. 6)

(4) ලෝකයේ රෝගාධික නගර බොහොමයක් ආසියාවේ ව්‍යාප්ත වී ඇති බැව් උදාහරණ දෙමින් පැහැදිලි කර ඊට හෙතු දක්වන්න. (ල. 6)

06. (1) ලෝකයේ පවතින ජනාවාස රටා තුනක් කටු සටහන් මගින් දක්වන්න. (ල. 4)

(2) දකුණු හා ගිණිකොණ ආසියා ප්‍රදේශවල පවතින ජනාවාස පිහිටීම් විග්‍රහ කරමින් එහි ලක්ෂණ උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න. (ල. 4)

(3) ශ්‍රී ලංකාවේ සැලසුම්ගත ජනාවාස පිහිටීමත් සමඟ පැවති ජනාවාස රටාව වෙනස් වූ බැව් එම යුග දෙක සසඳමින් සාකච්ඡා කරන්න. (ල. 4)

(4) ශ්‍රී ලංකාවේ නාගරික ජනාවාස වශයෙන් සලකන ප්‍රදේශ දක්වා නාගරික ජනාවාස ව්‍යාප්තිය හා ඊට හේතු වෙන වෙනම සාකච්ඡා කරන්න. (ල. 6)

07. (1) පහත දී ඇති ලෝක සිතියමේ දැක්වෙන ප්‍රදේශ ගල්අඟුරු, යපස් හා ඛනිජ තෙල් වශයෙන් වෙනවෙනම හඳුනාගෙන නම් කරන්න. (ල. 4)




(2) ඉහත දැක්වෙන ආකර කර්මාන්ත ආශ්‍රිත ප්‍රදේශවල ඇතිවී තිබෙන ගැටළු පරීක්ෂා කරන්න. (ල. 4)

(3) ලෝකයේ මෝටර් රථ සම්බන්ධයෙන් ඇතිවන ඉල්ලුම වැඩිකර ගැනීම සඳහා අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න. (ල. 6)

(4) ලෝකයේ මෝටර් රථ නිෂ්පාදනය හා වෙළඳාම ආශ්‍රිත කැපී පෙනෙන ලක්ෂණ සාකච්ඡා කරන්න.

(ල. 6)

08.




(1) ඉහත දී ඇති ශ්‍රී ලංකා සිතියමේ පවතින්නේ ප්‍රධාන ඛණිජ සම්පත් දෙවර්ගයක ව්‍යාප්ති සිතියමකි. එම ඛණිජ වර්ග නම් කර ප්‍රදේශ දක්වන්න. (ල. 4)

(2) ශ්‍රී ලංකා ආර්ථිකයට ඛණිජ සම්පත් කෙසේ වැදගත් වන්නේ දැයි උදාහරණ දෙමින් පහදන්න.(ල. 6)

(3) ශ්‍රී ලංකාවේ ඇතැම් ඛණිජ සම්පත් තවමත් අමුද්‍රව්‍ය ලෙසින් භාවිතා වන බැව් විස්තර කර දක්වන්න. (ල. 6)

(4) ඛණිජ සම්පත් උපයෝජනයේදී සිදුවන පාරිසරික හානි අවම කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග පහදන්න. (ල. 4)